# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 අගෝස්තු / සැප්තැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

**බෞද්ධ දර්ශනය** (නව/පැරණි නිර්දේශය)

**බෞද්ධ මනෝවිග්‍රහය හා ආචාර ධර්ම BUPH – E 2015**

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක (02) බැගින්වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## I කොටස

01. බෞද්ධ මනෝවිද්‍යාවෙහි පදනම සහ මූලික අරමුණු පහදන්න.

02. බෞද්ධ මනෝවිශ්ලේෂණයේ එන චිත්ත, මන සහ විඤ්ඤාණ යන ව්‍යවහාරයන්හි වැදගත්කම ගෙනහැර දක්වන්න.

03. පෞරුෂය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මනෝවිද්‍යාත්මක පදනමකින් හඳුනා ගැනීමේ හැකියාව ප්‍රකට කරන්න.

04. 'බෞද්ධ භාවනා විධි මගින් මිනිස් මනස උපරිම සංවර්ධනය දක්වා දියුණු කිරීමේ හැකියාව මනාව ප්‍රකට වේ.' විමසන්න.

05. අධිමානසික ශක්තීන් යනු මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කොට බෞද්ධ මූලාශ්‍රය ඇසුරින් ප්‍රකට වන අධිමානසික ශක්තීන් අනාවරණය කරන්න.

## II කොටස

06. "ආචාර ධර්ම" නිර්වචනය කොට බෞද්ධ ආචාර ධර්මයන්හි පදනම හා ස්වභාවය පැහැදිලි කරන්න.

07. ප්‍රාග් බෞද්ධ හා බුද්ධකාලීන භාරතයේ පැවති සදාචාර පද්ධති පිළිබඳ බෞද්ධ විචාරය ගෙනහැර දක්වන්න.

08. හොඳ-නරක පිළිබඳ බෞද්ධ නිර්ණායක යහපත් සමාජයක් ගොඩනැගීමෙහි ලා උපයෝගී වන ආකාරය පෙන්වා දෙන්න.

09. පුඤ්ඤ හා කුසල යන ව්‍යවහාරයන්ගෙන් නියෝජනය වන සදාචාර ධර්ම ප්‍රකට කරන්න.

10. 'ස්වච්ඡන්දතාව පිළිබඳ බුදුන්වහන්සේගේ විග්‍රහය පරමාදර්ශී ආචාරධර්ම පද්ධතියක ලක්ෂණ ප්‍රකට කරයි.' විමසන්න.

****************************